සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය - I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

සැ.යු. :-

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අකුරෙන් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණු කරන්න.

---

01. | ග ප ධ නි | ස් ධ ප | ම ග ම රි | ස රි ස | මෙම සර්ගම් ප්‍රස්තාරය අයත් වන්නේ,
(1) කාෆි රාගයටය. (2) බිලාවල් රාගයටය. (3) භෛරවී රාගයටය. (4) යමන් රාගයටය.

02. භූපාලි රාගයෙහි වර්ජිත ස්වර මොනවා ද?
(1) ධ, ග (2) ග, ධ (3) ම, නි (4) ග, නි

03. කාෆි රාගයේ අනුවාදී ස්වර මොනවා ද?
(1) ස රි <u>ග</u> ප ධ (2) ස <u>ග</u> ම ප <u>නි</u> (3) රි <u>ග</u> ම ධ <u>නි</u> (4) ස රි ප ධ <u>නි</u>

04. ''කඳු පෙළ අතරේ තුරුවදුලේ'' යන ගීතය,
(1) මධ්‍යලය ගීයකි. (2) සේ ගීයකි.
(3) ගැමි ගීයකි. (4) ශුද්ධ ස්වර ස්ථාපන ගීයකි.

05. ස ග රි ග ස, රි ම ග ම රි...... මෙම ස්වර අභ්‍යාසයෙහි ඊළඟ පියවර වන්නේ කුමක් ද?
(1) ග ප ම ප ග (2) ග ප ග ප ග (3) රි ම ග ම රි (4) ග ම ප ම රි

06. රාගයක කිසිසේත්ම නොයෙදෙන ස්වරය,
(1) අනුවාදී ස්වරයයි. (2) වර්ජිත ස්වරයයි. (3) විවාදි ස්වරයයි. (4) වාදී ස්වරයයි.

07. තිත් (^) සහ තෙයි (/) සංඥා යොදාගනු ලබන සංගීත සම්ප්‍රදාය වනුයේ කුමක් ද?
(1) කර්ණාටක (2) බටහිර (3) දේශීය (4) හින්දුස්ථානි

08. රාගයක වාදි සංවාදි ගාන සමය ආදී තොරතුරු ඇතුළත්ව ප්‍රබන්ධ වී ඇත්තේ කුමන ගී වර්ගයක ද?
(1) ලක්ෂණ ගී (2) සර්ගම් ගී (3) ඛ්‍යාල් ගී (4) භජන් ගී

09. ''ජග්ජිත් සිං'' සහ උස්තාද් ''ශකීර් හුසේන්'' සංගීතවේදීන් වඩාත් ප්‍රචලිත වී ඇත්තේ පිළිවෙලින්,
(1) සිතාරය තබ්ලාවට ය. (2) ගසල් භජන්වලට ය.
(3) තබ්ලාව ගසල්වලට ය. (4) ගසල් තබ්ලාවට ය.

10. ''ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ....'' මෙම ගී පාදයේ සඳස්මත් ගණන හා ගීමත් ගණන,
(1) 16 24 කි. (2) 16 16 කි. (3) 12 24 කි. (4) 24 18 කි.

11. ගීතය ආරම්භ වීමෙන් පසු ආඝාතය තැබීම,
(1) සමග්‍රහයයි. (2) විෂමග්‍රහයයි. (3) අවග්‍රයයි. (4) ග්‍රහයයි.


12. ජුපිටර් (Number 41) සිම්පනිය නිර්මාණය කළ සංගීතඥයා වන්නේ කව්ද?
   (1) ප්‍රේමසිරි කේමදාස (2) මෝසාර්ට් (3) බීතෝවන් (4) හයිඩ්න්

13. රජවරුන් සහ ප්‍රභුවරුන්ගේ ගුණ, තේජස අතිශයෝක්තියෙන් වර්ණනාවන ගීත විශේෂය වනුයේ කුමක්ද?
   (1) වන්නම් (2) භජන් (3) ප්‍රශස්ති (4) කව්වාලි

14. නව නාට්‍ය සම්ප්‍රදායට අයත් ගීත ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) ඕලු පිපීලා, එන්ඩද මැණිකේ
   (2) ගලන ගඟකි, රන්වන් දූල්
   (3) ගම්මල සැමතැන, සොකරි එන්නී
   (4) සෝභාව දේ මෙපුර, යස ඉසුරු පිරුණු තැනා

15. මුස්ලිම්වරුන්ට අනන්‍ය වූ ගායන ශෛලියක් වන්නේ කුමක් ද?
   (1) කව්වාලි (2) ගසල් (3) භජන් (4) ඛ්‍යාල්

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**




16. කායදා, පල්ටා, පරන් වැනි අංග වාදනය කළ හැකි භාණ්ඩය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද?
   (1) A (2) B (3) C (4) D

17. ස්වර පිහිටීම සමාන වුවත්, වාදනය කිරීමේ ශිල්ප ක්‍රමය අසමාන වන සංගීත භාණ්ඩ යුගලය අයත් වන්නේ,
   (1) A සහ C (2) A සහ B (3) B සහ E (4) A සහ D

18. පෙරදිග භාණ්ඩ වර්ගීකරණයට අනුව තත්, අවනද්ධ හා සුෂිර සංගීත භාණ්ඩ පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?
   (1) BCD (2) CDE (3) ABC (4) DEA


19. තත් හයකින් යුත් බටහිර සංගීත භාණ්ඩය අයත් ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
   (1) E (2) D (3) B (4) C

20. අඵවකින් (Bow), මිස්රාබයෙන් සහ පික් (Pick) යන උපකරණවලින් වාදනය වන භාණ්ඩ පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
   (1) ADE (2) DAE (3) EAB (4) BDE

21. සේ ගී හා මෙහෙ ගී වලට අයත් ගී පාද දෙකක් වන්නේ,
   (1) ඔළිඳ තිබෙන්නේ උදයට පායන හිරු දෙවියන්ටයි
   (2) වරමාතී සුභ චරිතේ බුද්ධං සරණේ
   (3) අතට වෙරළු ඇහිඳ ගෙනේ රූ රැසේ අඳිනා ලෙසේ
   (4) පැහැරණිය මිණිපැමිණිය තන්ඩලේ දෙන්න දෙපොලේ

22. ජන ගී වර්ගීකරණය අනුව නැළවිලි ගී අයත් වන්නේ,

- අංක 23 සිට 26 තෙක් ප්‍රශ්නවලට පහත ස්වර පුවරු රූප සටහන ඇසුරින් පිළිතුර සපයන්න.




23. G major සහ F major ස්කේලයන්ට (Scale) අයත් විකෘති ස්වර දෙක පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) 11 14 (2) 16 18 (3) 14 18 (4) 11 16

24. 8, 11, 15 ස්වර තුන එකතුවීමෙන් සෑදෙන කෝඩ් (Chord) එක කුමක් ද?

(1) F major (2) C minor (3) G minor (4) D major

25. මෙහි සඳහන් 6, 10, 13 ස්වර එකවර වාදනය කිරීමේදී එය අයත්වන කෝඩ් (Chord) එක වන්නේ,

(1) B Flat major (2) A Flat major (3) E Flat major (4) D Flat major

26. වයලීනයේ තත් සතර පෙරදිග ක්‍රමයට සුසර කරන ආකාරයට ගැලපෙන අංක දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) 1, 3, 5, 7 (2) 5, 8, 12, 15 (3) 3, 8, 15, 20 (4) 3, 7, 13, 17

27. නාදයේ ත්‍රිවිධ ගුණ ඇතුලත් පිළිතුර වන්නේ කුමක් ද?

(1) මන්ද්‍ර, මධ්‍ය, උච්ච (2) නාදය, ශබ්දය, ධ්වනිය
(3) කෝමළ, තීව්‍ර, ශුද්ධ (4) තාරතාවය, විපුලතාවය, ධ්වනි ගුණය

28. 256Hz, 512Hz ආදී වශයෙන් ස්වරයන්ගේ සංඛ්‍යාතයේ වෙනසට බලපාන නාදයේ ගුණය වන්නේ,

(1) ජාති භේදයයි. (2) තාරතාවයයි. (3) ධ්වනි ගුණයයි. (4) විපුලතාවයයි.

29. කටහඬ හෝ සංගීත භාණ්ඩවල නාදය ආරම්භයේ සිට ස්පීකර් වලින් ශ්‍රාවකයාට ඇසීම දක්වා ක්‍රියාවලියේ දී එම තාක්‍ෂණික උපකරණ සම්බන්ධ විය යුතු පිළිවෙල වන්නේ කුමක් ද?

(1) මයික්‍රෆෝනය → මික්සරය → ඇම්ප්ලිෆයරය → ස්පීකර්

(2) ඇම්ප්ලිෆයරය → ස්පීකර් → මයික්‍රෆෝනය → මික්සරය

(3) මික්සරය → මයික්‍රෆෝනය → ස්පීකර් → ඇම්ප්ලිෆයරය

(4) ඇම්ප්ලිෆයරය → මයික්‍රෆෝනය → මික්සරය → ස්පීකර්

30. පරිගණක සංගීතයේදී කටහඬ පටිගත කිරීම සඳහා භාවිතා කළ හැකි මෘදුකාංගයක් (Software) වන්නේ කුමක් ද?

(1) MS Office (2) Adobe Audition (3) Photoshop (4) Encarta

31. MIDI යන කෙටි යෙදුමෙහි අදහස දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

(1) සංගීතනාදවල හඬ වැඩිකර ඇසීමට සැලැස්වීමයි.
(2) සංගීත නාද දෙකක් අතර ඇති හඬෙහි වෙනසයි.
(3) සංගීත නාද විද්‍යුත් අංක ක්‍රමයකට පරිවර්තනය කිරීමයි.

- තබ්ලාවේ කොටස් දෙකෙහි මුහුණත් රූප සටහනක් පහත දැක්වේ. අංක 32 සි 34 දක්වා ප්‍රශ්ණවලට එම රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




(A) නිපදවා ගතහැකි අවනද්ධ අක්ෂර ගෙ, ග

(B) නිපදවා ගතහැකි අවනද්ධ අක්ෂර න, ත, තිං

32. A හා B රූප සටහන් දෙක තබ්ලාවේ කොටස් ලෙස පිළිවෙලින් දක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?
    (1) චාන්ටිය දයාව (2) මෛදන් ලවය (3) බායාව ගජ්රා (4) බායාව දායාව

33. A හා B කොටස් දෙකෙහි ඇති ශුද්ධ අක්ෂර දෙකක් එකවර වාදනය කිරීමෙන් නිපදවාගත හැකි මිශ්‍ර අක්ෂර මොනවා ද?
    (1) න, ධිං (2) ධ, ධිං (3) තිං, ත (4) ගෙ, ධිං

34. 1, 2, 3 අංක වලින් දක්වෙන කොටස් පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ කුමක් ද?
    (1) ෂියාහි, ලවය, චාන්ටි (2) ලවය, චාන්ටි, ගජ්රා
    (3) ෂියාහි, චාන්ටි, ලවය (4) ගට්ටා, ගජ්රා, චාන්ටි


35. ගීතයකට වඩා සංධ්වනියක ගති ලක්ෂණ ඇතුළත් වී ඇත්තේ කුමන සිංහල චිත්‍රපට ගීතයේ ද?
    (1) ඈත ගව් ගනන් දුරින් (2) ගලන ගඟකි ජීවිතේ
    (3) සිනිඳු සුදු මුදු තලාවේ (4) සීත රෑ යාමේ

36. සිංහල චිත්‍රපට සංගීතයේ සන්ධිස්ථානය වූ සිංහල චිත්‍රපටය සහ එහි ගී තනු නිර්මාණය කළ සංගීතඥයා ඇතුළත් පිළිතුර වන්නේ කුමක් ද?
    (1) මාතලන් ආර්. මුත්තුසාමි (2) සුජාතා ආනන්ද සමරකෝන්
    (3) අශෝක මාලා මොහොමඩ් ගවුස් (4) රේඛාව සුනිල් ශාන්ත

37. ගීතයක තාලයෙන් තොරව ගයන කොටස (දොහොරා) ව්‍යවහාරික සංගීතයේ දී හඳුන්වන්නේ කෙසේද?
    (1) Bits නමිනි. (2) Chorus නමිනි. (3) Interlude නමිනි. (4) Adlib නමිනි.

38. ව්‍යවහාරික සංගීතයේ දී ගී තනුව අතරතුර වාදනය වන කෙටි ස්වර ඛණ්ඩය හඳුන්වන්නේ,
    (1) Verse නමිනි. (2) Bits නමිනි. (3) Introduction නමිනි. (4) Adlib නමිනි.

- පහත සඳහන් බටහිර සංගීත ස්වර ප්‍රස්තාරය උපයෝගී කරගෙන අංක 39 හ 40 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



39. ඉහත සඳහන් ස්වර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කළවිට ලැබෙන නිවැරදි පිළිතුර කුමක්ද?
    (1) | ස ග පම | + ප ම ග | රි ස | ග |
    (2) | ස ග ග පම | + + පම ග | රි ස | ග |
    (3) | ස ග ගම | + + ප මග | රි ස | ග |
    (4) | ස රි ගම | + ප ම ග | රි | ස |

40. මෙම ප්‍රස්ථාරයට අනුකූලව තාලය සලකුණු කිරීමේදී (Time Signature) දක්විය යුත්තේ කුමන ආකාරයෙන්ද?
    (1) $\frac{2}{4}$ (2) $\frac{3}{4}$ (3) $\frac{4}{4}$ (4) $\frac{6}{8}$

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
# පෙරදිග සංගීතය - II

**11 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

**උපදෙස් :**
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) • **(i) සිට (vi) තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

i. | නිධම | පගුරි | සරිගු | මප | මෙම සර්ගම් ගී පාදය අයත් රාගය කුමක් ද?

ii. විෂය නිර්දේශයට අයත් ස්වර දොළහම භාවිතා කරන රාගය කුමක් ද?

iii. ගරිස ධ̣ සරිග, පග ධප ගරිස වශයෙන් මුඛ්‍යාංග ස්වර යෙදෙන රාගය කුමක් ද?

iv. යමන් රාගයේ අනුවාදී ස්වර ලියන්න.

v. ''සුවඳ පද්ම ඕලු ආදි'' යන නූර්ති ගීතය වාදනය කිරීමට සුදුසු තාලය නම් කරන්න.

vi. ජප්තාලයට සමානව මාත්‍රා බෙදී යන දේශීය තිත් රූපය නම් කරන්න.

• **හිස්තැන් පුරවන්න.**

vii. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව දවුල ........................................................... වර්ගයට අයත් වේ.

viii. ''මන්මත් කරවන දනමුළු දෙරණා'' යන සේගීය ........................................................... මත් පැදියකි.

ix. ................................................ විසින් නිර්මාණය කළ තබ්ලාව වාදනයෙහි ලා විශිෂ්ට භාරතීය සංගීතඥයෙකු වන්නේ ................................................ ය.

x. ''සේවිත පාද සරෝරුහ'' යනුවෙන් ඇරඹෙන්නේ ...................................... වන්නම වන අතර ''කොහොවියනා හඬ නඟනා'' යනුවෙන් ඇරඹෙන්නේ ...................................... වන්නමයි.

(ලකුණු 12

(02)

| | රාගය | ථාට්‍යය | රාගජාතිය | ආරෝහණ | අවරෝහණ | වාදි සංවාදි | මුඛ්‍යාංගය | ගාන සමය |
|---|---|---|---|---|---|---|---|---|
| A | | භෛරවී | සම්පූර්ණ | ............ | ස් නි ධ ප ම ග රි ස | ............ | මගසරිස ධ̣නි̣ස | ............ |
| B | භූපාලි | ............ | ............ | ස රි ග ප ධ ස් | ............ | ග ධ | ............ | රාත්‍රී ප්‍රථම ප්‍රහරය |
| C | .......... | කාෆි | ............ | ස රි ගු ම ප ධ නි ස් | ස් නි ධ ප ම ගු රි ස | ............ | ............ | රාත්‍රී දෙවන ප්‍රහරය |

i. ඉහත වගුවෙහි එක් එක් පේළියෙහි ඉංග්‍රීසි අකුර ද, පිළිවෙලින් අදාල පිළිතුරු සතරද ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ල.06)

ii. ඉහත වගුවෙහි ඇතුළත් රාග අතුරින් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටස නියමිත තාල සංකේත සහිතව ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
නැතහොත්
වාදිතයක ස්ථායි කොටස නියමිත තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ල.04)

iii. ඉහත වගුවෙහි ඇතුලත් නොවූ නිර්දේශිත වෙනත් රාගයක පහත විස්තර සපයන්න. (ල.02)
a. ආරෝහණ b. අවරෝහණ c. වාදී / සංවාදී d. මුඛ්‍යාංගය

(03) උඩරට, පහතරට හා සබරගමු වන්නම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.
වන්නම් 18, දෙවොල් මඩු, උකුසා වන්නම, වන්නම් 32, පහන්මඩු, කොටස්පහකි, සීරුමාරුව, කොටස් 04 කි, කලාසම, තිසරාවන්නම, අඩව්ව, උපුල්වන් දෙවිඳු, කස්තිරම, කෝකිලවන්නම, නළුගීතිකාතාලයි, නෛයඩිවන්නම, කොටස් 06 කි, ගම්මඩු, ඉරට්ටිය, තාලය හා වෘතය, අඩව්ව.

i. ඉහත තොරතුරු එම වන්නම් වලට අදාළව වගුගත කරන්න. (ල.06)

ii. ඉහත වන්නම් අතුරින් එක් වන්නමක කවි පාදයක් තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල.03)

iii. උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්ට අයත් තාල වාද්‍ය භාණ්ඩ පිළිවෙලින් නම්කරන්න. (ල.03)

(04) පහතින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ නූර්ති හා නාඩගම් රංග සම්ප්‍රදයයන් දෙකට අයත් තොරතුරු කීපයකි.


- කර්ණාටක සංගීතයේ ආභාසය
- දොහොරාව භාවිතය
- හින්දුස්ථානී සංගීතයේ ආභාසය
- මද්දල් දෙකක් වාදනය
- උරුට්ටුව භාවිතය
- තබ්ලාව, සර්පිනාව භාවිතය
- පොතේ ගුරු විසින් චරිත සභාවට හඳුන්වා දීම.
- විශ්වනාත් ලෞජි ආදීන්ගේ සංගීත දායකත්වය.

i. ඉහත රංග සම්ප්‍රදයන් දෙකට අදාළ තොරතුරු වගුගත කරන්න. (ල.04)

ii. ඉහත එක් රංග සම්ප්‍රදයකට අයත් ගීතයක මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.04)

iii. රංග සම්ප්‍රදයන් දෙකට අයත් නාට්‍ය දෙක බැගින් නම් කරන්න. (ල.04)

(05) පහත දී ඇති බටහිර සංගීත ස්වර ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. අංක 1 8 දක්වා අංක වලට අදාළ සංකේත නම් කරන්න. (ල.04)

ii. ඉහත ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ල.04)

iii. ඉහත ප්‍රස්තාරයට අදාළ ස්කේලය (SCALE) නම් කර එම ස්කේලයෙහි ස්වර ලියා දක්වන්න. (ල.04)

(06) පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

<table>
<tr><th></th><th>ගීතය</th><th>හින්දුස්ථානි තාලය</th><th>දේශීය තාලය</th><th>බටහිර තාලය</th></tr>
<tr><td>A</td><td>| සුපිපුණු | සුගන්ධ | යුත්සොඳ | පුෂ්පාs |</td><td>1. ......................</td><td>මහතනිතිත</td><td>2. ..................</td></tr>
<tr><td>B</td><td>| + සසු ර | වසන | තුරුs | sss |</td><td>3. ......................</td><td>4. ......................................</td><td>3/4</td></tr>
<tr><td>C</td><td>| ඇසේs | මතුවන | කඳුළු | බිඳුගෙන |</td><td>5. ......................</td><td>මැදුම් මහ දෙතිත</td><td>6. ..................</td></tr>
<tr><td>D</td><td>සු | නිල් | වන්නු | වන් | යු ග ව |</td><td>ජප්තාලය</td><td>7. ......................................</td><td>8. ..................</td></tr>
<tr><td>E</td><td>| ඕsලු නෙළුම් | නෙරිය රඟාs | ලාss sss |</td><td>9. ......................</td><td>මැදුම් තනිතිත කඩිනම් ලය</td><td>10. ................</td></tr>
</table>

i. ඉහත වගුවෙහි හිස්තැන්වල සඳහන් අංකවලට අදාළ පිළිතුරු සපයන්න. (ල.05)

ii. C තීරුවට අයත් හින්දුස්ථානි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල.04)

iii. D තීරුවට අයත් දේශීය තිත් රූපයට අදාල බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.03)

(07) i. ශ්‍රී ලාංකීය සංගීතයේ ප්‍රගමනය සඳහා දායක වූ ග්‍රැමෆෝන් ගීත, ගුවන් විදුලි සරල ගීත, කපිරිඤ්ඤා යන ගී අතුරින් <u>එකක් පිළිබඳව</u> පහත සඳහන් කරුණුවලට අදාළව විස්තර කරන්න.

- ආරම්භය හා ව්‍යාප්තිය.
- සංගීත නිර්මාණකරුවන් හා ගායික ගායිකාවන්
- ප්‍රචලිත ගීත
- සංගීතමය ලක්ෂණ

(ල.08)

ii. ඉහත ඔබ විසින් තෝරා නොගත් ගීත වර්ග දෙකෙන් එකකට අයත් ගීතයක මුල් කොටස ලියන්න. (ල.04)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය**

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) (i) ගුරුවරයා 'ආ' කාරයෙන් ඉදිරිපත් කරන ස්වර ස්ථාපන ගී පාදයේ වචන හඳුනාගෙන නම් කරන්න. (ගුරුවරයාගේ අභිමතය පරිදි ස්වර ස්ථාපන ගීයක් ගායනා කළ හැක.) (ල.05)

(ii) ගුරුවරයා 'ආ' කාරයෙන් ඉදිරිපත්කරන ස්වර අභ්‍යාසයේ මුල් ස්වර හතර හඳුනාගෙන නම් කරන්න. (ගුරුවරයාගේ අභිමත පරිදි සරල ස්වර අභ්‍යාසයක් 'ආ' කාරයෙන් ගායනය කරන්න.) (ල.05)

(iii) ගුරුවරයා වයනු ලබන තබ්ලා පදය හඳුනාගෙන නම් කරන්න. (ල.05)

(iv) ගුරුවරයා ගයනු ලබන නූර්ති ගී / නාඩගම් ගී / නව නාට්‍ය ගී / ග්‍රැමෆෝන් ගී / සරළ ගී පිළිබඳව ඔබ අසා ඇති තොරතුරු (මුල් ගායකයා / නාට්‍ය අධ්‍යක්ෂකවරයා / නාට්‍යයේ නම / සංගීතය) විස්තර කරන්න. (ල.05)

(02) විෂය නිර්දේශයට අයත් රාග අතරින් ඔබ කැමති රාගයක මධ්‍යලය ගීයක් හෝ වාදිතයක් තානාලංකාර දෙකක් සමගින් ගායනය හෝ වාදනය කරන්න.

- ආරෝහණ / අවරෝහණ (ල.04)
- ස්ථායි (ල.06)
- අන්තරා (ල.06)
- තානාලංකාර දෙකක් (ල.04) (ල.20)

(03) ආඝාතාත්මක හෝ අනාඝාතාත්මක ජන ගීයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.20)

(04) (i) ගුරුවරයා නම් කරනු ලබන තාල පදයක් අතින් තාල දමා නිරූපණය කරන්න. (ල.10)

(ii) ස්වර පුවරු සංගීත භාණ්ඩයකින් මධ්‍යලය ගී / සර්ගම් ගී / නූර්ති ගී නාඩගම් ගී / සරල ගී යන ගී වර්ග වලින් එක් ගී වර්ගයක් වාදනය කරන්න. (ල.10)

(05) ස්වර වාද්‍ය භාණ්ඩයකින් මධ්‍යලය ගී / සර්ගම් ගී / නූර්ති ගී / නාඩගම් ගී / සරල ගී / ග්‍රැමෆෝන් ගී යන ගී වර්ග වලින් එකක් වාදනය කරන්න. (බටනලා, සිතාර්, වයලින්, එස්රාජ්, දිල්රුබා, ගිටාර් ආදී ස්වර වාද්‍ය භාණ්ඩ)

හෝ

තබ්ලාව වාදනය කරන්නේනම් තාල පදයක් වාදනය කරන්න. (ල.20)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(3) | 4 -(4) | 5 -(1) | 6 -(2) | 7 -(3) | 8 -(1) | 9 -(4) | 10 -(1) |
| 11-(2) | 12 -(2) | 13 -(3) | 14 -(4) | 15 -(1) | 16 -(2) | 17 -(4) | 18 -(3) | 19 -(1) | 20 -(2) |
| 21-(4) | 22 -(4) | 23 -(3) | 24 -(2) | 25 -(1) | 26 -(3) | 27 -(4) | 28 -(2) | 29 -(1) | 30 -(2) |
| 31-(3) | 32 -(4) | 33 -(2) | 34 -(1) | 35 -(3) | 36 -(4) | 37 -(4) | 38 -(2) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය

(01) i. කාෆි රාගය ii. භෛරවී රාගය iii. භූපාලි රාගය
iv. ස, රි, ම', ප, ධ v. දාදරා තාලය vi. සුළු මැදුම් දෙතිත
vii. විතතාතත viii. සොළොස්
ix. අමීෂ් බුෂ්රු, ශබීර් හුසේන් (නිවැරදිව වෙනත් තබ්ලා වාදකයකුගේ නමක් සඳහන්කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.)
x. පහතරට, සබරගමු, කෝකිල (එක් පිළිතුරකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 12 යි.)

(02) i. වගුවෙහි එක් පිළිතුරකට (ල. ½ x 12 = 06)
A හි ගානසමය දිවා ප්‍රථම හෝ සර්ව කාලීන යන පිළිතුරු දෙකම නිවැරදි ලෙස සලකන්න.
ii. තාල සංඥා සහිතව නිවැරදිව ප්‍රස්ථාර කර ඇත්නම් (ල. 04)
iii. බිලාවල් හෝ යමන් රාග දෙකින් එකක, දී ඇති රාග විස්තර හතරක් ලියා ඇත්නම් (ල. ½ x 4 = 02)

(03) i.

| උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|
| • වන්නම් 18 | දෙවොල් මඩු | පහන් මඩු |
| • උකුසා වන්නම | වන්නම් 32 | කොටස් 05 කි. |
| • සීරු මාරුව | කොටස් 04 කි. | කලාසම |
| • කස්තිරම | උපුල්වන් දෙවිඳු | තිසරා වන්නම |
| • නෛයඩි වන්නම | නළුගීතිකා තාලය | අඩව්ව |
| • කොටස් 06 කි. | ගම්මඩු | කෝකිල වන්නම |
| • අඩව්ව | ඉරට්ටිය | |
| | තාලය හා වෘතය | |

(ල. 06)

ii. කවි පාදය ප්‍රස්ථාර කිරීමට (ල.02) / තිත් සංඥා නිවැරදි වීම (ල.01)
iii. නිවැරදිව පිළිවෙලින් තාල වාද්‍ය භාණ්ඩ නම් කිරීමට (ල. 03) (මුළු ලකුණු 12)

(04) i. නූර්ති සහ නාඩගම් ලෙස කරුණු නිවැරදිව වගු ගත කර ඇත්නම් (ල. 04)
ii. එක් රංග සම්ප්‍රදායකට අයත් ගීතයක් ප්‍රස්ථාරකර ඇත්නම්. (ගී පද පමණක් ඇතිවිට ලකුණු 2 යි.) (ල. 04)
iii. නාට්‍ය දෙක බැගින් නම් කිරීමට (ල. 04) (මුළු ලකුණු 12)

(05) i. (1) Treble clef (2) Key Signature (3) Time Signature
(4) Crotchet Restmark (5) Crotchet (6) Tie
(7) Dotted Minim (8) Minim එක් පිළිතුරකට ½ x 8 = 04
ii. |+ සම ම ම | පධ නිධ ප | ස | ධ පධ ම | (ල. 04)
iii. F major scale
ම ප ධ නි ස රි ග ම | F G A $B^{b}$ C D E F
නම්කිරීමට ලකුණු 02 යි. (ල. 04) (මුළු ලකුණු 12)

(06) i. එක් පිළිතුරකට ½ x 10 = ල. 05
ii. තාල සංඥා සහිතව තාලය ප්‍රස්තාර කිරීම ල. 04
iii. තිත් රූපයට අදාළ බෙරපදයක් ප්‍රස්ථාර කිරීමට ල. 03) (මුළු ලකුණු 12)

(07) i. තෝරාගත් මාතෘකාව ඊට අදාළ කරුණු ඇසුරින් විස්තර කිරීමට (ල. 08)
ii. ගීතයක මුල් කොටසක් ලිවීමට (ල. 04) (මුළු ලකුණු 12)